**කාත්තන්කුඩි නගර සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාත්තන්කුඩි නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කවෂිමා යන්ත්‍රය සවි කිරීම සඳහා රු.67,907,157 ක් වියදමින් ඉදි කරන ලද ගොඩනැගිල්ලේ සහ රු.22,858,774 ක් වැය කර ඉදිකරන ලද පරිපාලන ගොඩනැගිල්ලේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ ඔබගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කරන බව. | වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාලයන් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත් 3,352 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටද සහ විනාශ කරන ලද රු.175,043 ක් වටිනා පොත්වල අගය ගිණුම්වලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | පුස්තකාල සඳහා පරිත්‍යාග වශයෙන් ලැබූ පොත්වල වටිනාකම තක්සේරු කළ අතර, විනාශ කරන ලද පොත්වල වටිනාකමද ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව. | පුස්තකාල පොත්වල වටිනාකම ගැලපීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,273,371,337 ක් වටිනා ගිණුම් ශේෂ 09 ක් ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | ඉඩම් ඔප්පු ලබා ගැනීමට සහ යන්ත්‍රෝපකරණ, මෝටර් වාහන, ලී බඩු සවිකිරීම්වලට අදාල ලියවිලි ලබා ගැනීමට කටයුතු කරන බව. | වත්කම් වල ලියවිලි ලබා ගෙන ලේඛන ගත කිරිමට කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස අමාත්‍යංශයේ නාගරික සංවර්ධන අධිකාරියේ 2020 මාර්තු 02 දිනැති අංක 29 දරණ චක්‍රලේඛය | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම දින 14 ක් ඇතුලත නිම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මාස 06 සිට 11 දක්වාවූ කාල ප්‍රමාදයකින් ගොඩනැගිලි සැළසුම් සභාව විසින් අනුමත කර තිබුණි. | ඉදිරියේදි මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව. | ගොඩනැගිලි සැළසුම් කඩිනමින් අනුමත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,567,389 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,523,357 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 21,612,000 | 22,371,641 | 20,367,473 | 11,594,381 | 21,258,000 | 19,956,284 | 20,229,692 | 9,590,213 |
| කුලී | 12,420,000 | 7,495,627 | 7,287,527 | 208,100 | 8,905,000 | 6,366,269 | 6,366,269 | - |
| බලපත්‍ර ගාස්තු | 4,060,000 | 4,088,230 | 4,073,780 | 38,000 | 4,060,000 | 3,671,125 | 3,666,125 | 23,550 |
| වෙනත් ආදායම් | 124,804,000 | 100,644,294 | 100,582,287 | 5,614,576 | 45,475,000 | 86,667,192 | 86,673,612 | 5,552,569 |
| **එකතුව** | **162,896,000** | **134,599,792** | **132,311,067** | **17,455,057** | **79,698,000** | **116,660,870** | **116,935,698** | **15,166,332** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිළධාරීන්ගෙන් ඉකුත් වර්ෂ 05 ට අදාල මුද්දර ගාස්තු රු.6,245,270 ක මුදලක් අය විය යුතුව තිබුණි. | අදාල මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇති බව. | මුද්දර ගාස්තු සම්බන්ධයෙන් විස්තරාත්මක ලියවිලි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් වශයෙන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් දක්වා තිබූ ජල සැපැයුම් ණය හිමි රු.6,643,239 ක මුදල ගෙවා නිම කිරීමට හෝ කපා හැරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක සිට පවතින මෙම මුදල අයකිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් අවශ්‍ය උපදෙස් විමසා ඇති බව. | ජල සැපයුම් ණය මුදල ගෙවීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් රථ වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රවර්ධන වර්ෂයේ වත්කම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | ස්ථාවර වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | කාත්තන්කුඩි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදනය කර නොතිබුණද, සභාව විසින් පුවත්පත් දැන්වීම් මගින් මිල ගණන් කැඳවීම සඳහා රු.142,311 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීමෙන් අතහැර දමා තිබුණි. | මෙම ව්‍යාපෘති අත්හැරීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර මූල්‍ය ප්‍රතිපාදන ඇති බවට සහතික විය යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු අළුත්වැඩියා කළ හැකි වාහන 05 ක් අළුත්වැඩියා කිරීමට සහ ධාවන තත්ත්වයේ නොපවතින වාහන 06 ක් සුදුසු පරිදි අපහරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි කටයුතු කරන බව. | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ට්‍රැක්ටර් ටේලර් යන්ත්‍ර ඇතුළු වාහන 09 ක් සඳහා ලියාපදිංචි සහතික සභාව සතුව නොතිබුණි. | වාහනවල ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කරන බව. | වාහන ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයහි තනතුරු 12 ක පුරප්පාඩු 27 ක් සහ අතිරික්ත 12 ක් විය. | සභා තීරණ ලබා ගෙන පුරප්පාඩු පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලුම් කළ ද, ප්‍රගතියක් නොමැති බව. | සේවක පුරප්පාඩු පිරවීමට සහ අතිරික්තය විධිමත් කර ගැනීමට කටයුතු කර යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| සභාවේ කාර්ය මණ්ඩලයේ 02 දෙනෙකුට ලබා දී තිබුණු ආපදා ණය සහ වෙනත් ණය සම්බන්ධයෙන් අයවිය යුතු රු.315,000 ක් අයකර ගැනීම සඳහා ඉකුත් වර්ෂ 07 ක කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මියගිය නිලධාරියාගේ මාසික වැන්දඹු හා අනත්දරු අරමුදලෙන් අයවෙමින් පවතින බව. | හිඟ සේවක ණය අයකර ගත යුතුය. |